# ශ්‍රී ලාංකික  මහජන සම්බන්ධතා ඉතිහාසයේ සංකේතය “ශ්‍රී දන්ත ධාතූන්වහන්සේ”

එච්. එම්. සමීර නුවන් හේරත්*

ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීමෙ පටන් අතීත මානව සබඳතා විවරණය කිරිමේදී දක්නට ලැබෙන්නේ. එම ශුද්ධ වස්තුව සම්බන්ධ කරගනු ලැබූ පාලන තන්ත්‍රයි. රාජ්‍ය පාලකයාත් මහජනතාවත් අතර මහජන සම්බන්ධතාව පවත්වා ගැනිමට සංකේතයක් වශයෙන් ශ්‍රී දන්ත ධාතුන්වහන්සේගේ හිමිකාරිත්වය පාලකයා සතුවිය. ශ්‍රී දන්ත ධාතුන්වහන්සේත් පාත්‍රා ධාතුවත් සුරුකිම රාජ්‍ය පාලකයාට උරුම විය. අනුරාධපුර රාජධානියේ සිට මහනුවර රාජධානිය දක්වා දේශපාලනික අරගල, සතුරු ආක්‍රමන ඇති වන්නේත්, රාජධානි සංක්‍රමණය සිදූවන්නේත් ශ්‍රී දළදා වහන්සේගේ ආරක්‍ෂාව වෙනුවෙනි. රාජ්‍ය පාලකයාත් ශ්‍රී දළදා වහන්සෙත් අතර පැවති දේශපාලනික සබඳතාව විදෙස් රජවරුන් පිළිගත්තේය. උඩරට අවසන් රජතුමා වූ නායක්කාර වංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ මහජන සම්බන්ධතාව පිරිහිම හේතුවෙන් ඉංග්‍රිසි පාලකයන් උඩරට බලය අල්ලා ගැනිමටත් රජු පහකර දැම්මටත් උපක්‍රම යොදයි. 1815 උඩරට ගිවිසුමට අනුව රට පාලනය කිරිමට වගකිම ගන්නා ඉංග්‍රිසීන් උඩරට ගිවිසුමේ පස්වන වගන්තියට අනුව බුදූදහමත් භික්ෂුන් වහන්සේලාත් ආරක්‍ෂාකර ගැනිමට පොරොන්දූ වූහ. නමුත් එය බිඳ දැමිය. ඒම ඓතිහාසික සිද්ධිය පදනම්ව බෞද්ධ පුනරුදයක් ඇති විය. මේවාට මුලික වූයේ ශ්‍රී දන්ත දාතුන් වගන්සේගේ හිමිකාරිත්වය අවිනිශ්චිත විමයි. සිංහලයාට හිමි නිදහස ද අහිමිවිය. ඉංග්‍රිසි පාලකයන්ට මෙරට භික්‍ෂුන් රදළ ප්‍රධානින් හා රටවැසියා සමඟ මහජන සම්බන්ධතාව සාර්ථකව පවත්වා ගැනිමට නොහැකි විය. ඔවුන් දළදා වහන්සේ දියවඩන නිලෙමේතුමාටත් අස්ගිරි හා මල්වතු මහානායක හිමිවරුන්ටත් භාරකිරිමෙන් 1815 උඩරට ගිවිසුමේ  පස්වැනි වගන්තිය සම්පුර්නයයෙන් බිඳ දැමිය. බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව බෞද්ධ පුනුරුදය ඇතිවිය එය නිදහස් සටනක් දක්වා වර්ධන වු අතර නිදහස ලබා ගැනිම දක්වා ව්‍යාප්ත විය.

මෙම අධ්‍යයන ගැටලූව වශයෙන් දක්වන්නේ මෙරට කිසිවිටෙක ශ්‍රී දළදා වහන්සේට හිමි ගෞරවය පාලකයාගෙන් ගිලිහියාමක් සිදුවුහොත් ඇතිවෙන ගැටලූකාරි තත්වය දැක්විමයි. මෙහි අරමුණවන්නේ උක්ත ඓතිහාසික සිදූවිමෙහි පැවති මහජන සම්බන්ධතා ආරවුල පාදක කරගනිමින් ශ්‍රී දළදා වහන්සේට හිමිවිය යුතු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳ සමාලෝචනයක් කිරිමයි. එහිදි 1815 උඩරට ගිවිසුම බිදවැටිමට හේතු වු ඉංග්‍රිසින්ගේ මහජන සම්බන්ධතාවයේ ගැටලු මානව චර්යාවක් වශයෙන් ආගමික, දේශපාලනික, ජනවාර්ගික, සංස්කෘතිකමය යුධමය සාදක ඔස්සේ ගවේෂණය කරනු ලබයි. මෙයට මුලාශ්‍ර වශයෙන් සාහිත්‍ය ග්‍රන්ථ ඡායාරූප, සගරා, පුවත්පත් හා සාකච්ඡා භාවිතා කොටගෙන උක්ත සිදූවිමේ මහජන සම්බන්ධතාව මානව විද්‍යාත්මක විග්‍රහයකට ලක්කිරිම සිදූවෙයි.

ප්‍රමුඛ පද - ශ්‍රී දළදා වහන්සේ, රාජ්‍ය පාලකයා, ඉංග්‍රිසි පාලකයන්, බෞද්ධ පුනුරුදය

* මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය smcherath@gmail.com